අධ්‍යාපන හා උසස් අධ්‍යාපන
චක්‍රලේඛ අංක: 93/16

මගේ අංකය: 4/විගි4/49 (II)
අධ්‍යාපන උසස් අධ්‍යාපන හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.
1993.07

සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු/ප්‍රධාන ගණකාධිකාරීවරු,
ප්‍රා.අ.අධ්‍යක්ෂවරු/නි.අ.අධ්‍යක්ෂවරු/ගණකාධිකාරුවරු
හා කලා. අධ්‍යාපන කාර්යාලවල මුදල් සහකාරවරුන් වෙත.

## රජයේ නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම්වලට අදාලව අවසාන වැටුප් විස්තර ලේඛන නිකුත් කිරීම

රජයේ නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම්වලට අදාලව (ගුරු භවතුන් ඇතුලුව) දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නිකුත් කරනු ලබන, මාරුවී ගිය පසුව යවන අවසන් වැටුප් විස්තරය හා නිලධාරියාගෙන් අය විය යුතු ණය/ අත්තිකාරම් පිළිබඳ ණය ශේෂ විස්තරය ඇතුලත් ආකෘති පත්‍රය නිකුත් කිරීම අනිවාර්යයෙනි.

02 නිලධාරියෙකු මාරුවී ගිය පසුව යවන වැටුප් විස්තරය හා ණය සේවා විස්තරය අදාල දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ලියා පදිංචි තැපෑලෙන් යැවිය යුතු බව, මෙයට පෙර බොහෝ අවස්ථාවලදී දන්වා කර ඇති නමුත්, ඇතැම් අවස්ථාවලදී මෙම ක්‍රියා පරිපාටිය උල්ලංඝනය කර ඇති බවත්, ඒ හේතුවෙන් අයථා සිද්ධීන් සිදුවී ඇති බවටත් වාර්තා වී ඇත. එම සිද්ධීන් නම් :-

(I) වැටුප් විස්තරයේ අන්තිමට ගෙවූ මාසික වැටුප හා ඊට අදාල වාර්ෂික වැටුප යන තීරු දෙකේ ඉලක්කම් වෙනස්කර වැඩි වැටුපක් ලබාගෙන තිබීම.

(II) වැටුප් රහිත නිවාඩුවලට අදාල රජයට අයකර ගත යුතු මුදල් තීරුවේ, ඉලක්කම් වෙනස් කර, වැටුප් රහිත නිවාඩු සඳහා මුදල් අයකර ගැනීම වැළැක්වීම.

(III) ලබාගෙන ඇති ණය හා අත්තිකාරම් මුදල්වලට අදාල තීරුවල ඉලක්කම් වෙනස්කර සත්‍ය ණය ශේෂය අයකර ගැනීම වැළැක්වීම.

03 එහෙයින් නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම්වලදී නිකුත් කරනු ලබන, මාරු වී ගිය පසුව යවන අවසාන වැටුප් විස්තරයේ මුල් පිටපත කුමන හේතුවක් නිසාවත්, ස්ථාන මාරුවීම් ලබාගෙන යන නිලධාරියාගේ අතට පත් නොකළ යුතු අතර, එය අදාල දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ලේඛන ගත තැපෑලෙන්ම යැවිය යුතුය. වැටුප් විස්තර ලේඛනයෙහි පිටපතක් ස්ථාන මාරුවීම ලබාගෙන යන නිලධාරියාට නිකුත් කිරීම සම්බන්ධයෙන් විරුද්ධත්වයක් නොමැති අතර, 'පිටපතකි' යන්න එහි පැහැදිලිව සඳහන් කළ යුතුය. එමෙන්ම වැටුප් ගෙවීම් කටයුතු හා අනෙකුත් කටයුතු සඳහා එකී පිටපත උපයෝගී කරගන්නේ එහි මුල් පිටපත ලැබීමෙන් පසුව, එය සමඟ සසඳා බලා නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට යටත්ව විය යුතුය. මුල් පිටපත ලද පසුව, එයට අනුකූලව කටයුතු කළ යුතුය.

04 ගුරු භවතුන්ද ඇතුලුව නිලධාරියෙකු මාරුවී පැමිණි පසුව, ඔහුගෙන් ලබාගන්නා, "අවසන් වරට ගෙවන්නා ලද වැටුප හා අඩු කිරීම් පිළිබඳ විස්තර" ඇතුලත් ප්‍රකාශය උපරිම වශයෙන් මාසයක කාලයක් සඳහා පමණක් පිළිගත යුතු අතර, එම කාලය අතරතුර වැටුප් විස්තර හා ණය ශේෂ විස්තර (නිලධාරියෙකුට මාරුවී ගිය පසුව යවන වැටුප් විස්තරය හා ණය සේශ විස්තරය) කලින් සේවය කළ ආයතනය අයන් කාර්යාලයෙන් ගෙන්වා ගත යුතුය.

05 කිසියම් නිලධාරියෙකු හිතා මතාම මාරුවී ගිය පසුව යවන වැටුප් විස්තරය හා ණය ශේෂ විස්තරය විකෘති කර ඇත්නම්, එම නිලධාරියාට විරුද්ධව විනයානුකූලව කටයුතු කළ යුතුය.

මෙම චක්‍ර ලේඛය ලද බව හා ඒ අනුව කටයුතු කිරීමට සටහන් කරගත් බව කරුණාවෙන් සනාථ කරන්න.

එන්.වී.කේ.කේ වේරගොඩ
ලේකම්,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන,
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

පිටපත්:-

1. පළාත් අධ්‍යාපන ලේකම්වරුන්, දැන ගැනීම පිණිස
2. ගණකාධිකාරී (ගෙවීම්) දැන ගැනීම පිණිස
3. ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන) දැන ගැනීම පිණිස